# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1971/18 - 2016 ජූනි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2016.06.16**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමග කියවිය යුතු 22 වැනි වගන්තියෙන් ගරු මුදල් අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2016 අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි පනවන ලද අංක 1956/19 දරන 2016.03.02 දිනැති *ගැසට්* නිවේදනයෙහි සඳහන් වූ පහත දක්වෙන නියමය 2016.05.19 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2016 ජූනි මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

2014 ඔක්තෝබර් මස 24 වැනි දිනැති අංක 1885/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 972 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

*රීති*

1. මෙහි I වැනි උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් වන ද්‍රව්‍ය මත ඊට අනුරූපීව එම උපලේඛනයේ II වැනි තීරුවේ නිශ්චිත වශයෙන් දක්වා ඇති ප්‍රමාණයන් මත, උපලේඛනයේ III වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති පරිදි සුරා බද්දක් පනවනු ලබන්නේය.

2. යම් පුද්ගලයකු විසින් ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීමට අදහස් කරන්නේ නම්, ඔහු මෙහි II වැනි උපලේඛනයේ සඳහන් පරිදි අයදුම්පත්‍රයක් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම්, ඔහු විසින් මෙහි III වැනි උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව වූ අනුමැතිය ආනයන හා අපනයන පාලක වෙත ලබා දිය යුතු ය.

4. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්නොවන්නේ නම් එම අයදුම්පත්‍රය ලැබී දින පහක් ඇතුළත එය ප්‍රතික්ෂේප කිරීමට හේතු සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අයදුම්කරු වෙත දැන්විය යුතු ය.


1A - PG 2982 — 107 (2016/06)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. ඊතයිල් මද්‍යසාර ශ්‍රී ලංකා රේගුවට ලැබීමෙන් පසු මෙහි IV වැනි උපලේඛනයේ සඳහන් ලිපිය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කර, එය එකී ද්‍රව්‍ය නිදහස් කර ගැනීම සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. සුරාබදු පිළිබඳව වූ ගාස්තුව ගෙවීමෙන් පසු සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ආනයනික ඊතයිල් මද්‍යසාර සඳහා අවසර පත්‍රයක් සහ එකී ආනයනික ඊතයිල් මද්‍යසාර ප්‍රවාහනය සඳහා අවසර පත්‍රයක් ද මෙහි V වැනි උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුව නිකුත් කළ යුතු ය.

7. සුරාබදු කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ආනයනය සඳහා වූ අවසර පත්‍රය බලපත්‍ර ස්ථානයේ දී සුරාබදු නිලධාරින් විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලූවිට එය ලබා දිය යුතු ය.

## *I උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* | |
|---|---|---|---|
| *ද්‍රව්‍ය* | *මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය* | *බදු ප්‍රමාණය (තොග ලීටරයට රුපියල්)* | |
| | | *දේශීය සැපයුම* | *ආනයන* |
| 1 රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 10,000 දක්වා | නිදහස් | නිදහස් |
| | සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය සඳහා ලීටර් 20,000 දක්වා | | |
| | ලීටර් 10,001 සිට ලීටර් 20,000 දක්වා | රු. 600/= | රු. 700/= |
| | ලීටර් 20,000 ට වැඩි | රු. 1,000/= | රු. 1,100/= |
| 2 අවසන් නිපැයුම සුරාබදු ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 500 දක්වා | නිදහස් | රු. 200/= |
| | ලීටර් 501 සිට ලීටර් 10,000 දක්වා | රු. 600/= | රු. 700/= |
| | ලීටර් 10,001 සිට ලීටර් 20,000 දක්වා | රු. 700/= | රු. 800/= |
| | ලීටර් 20,000 ට වැඩි | රු. 1,100/= | රු. 1,200/= |
| 3 අවසන් නිපැයුම සුරාබදු ගෙවීමට යටත් නොවන, අපනයන නිපැයුම් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සේදීම සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මධ්‍යසාර | ලීටර් 500 දක්වා | නිදහස් | නිදහස් |
| | ලීටර් 501 සිට ලීටර් 10,000 දක්වා | රු. 600/= | රු. 700/= |
| | ලීටර් 10,001 සිට ලීටර් 20,000 දක්වා | රු. 700/= | රු. 800/= |
| | ලීටර් 20,000 ට වැඩි | රු. 1,100/= | රු. 1,200/= |
| 4 අශුද්ධ ඊතයිල් මද්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/දුර්වල ස්ප්‍රීතු සඳහා) | සෑම ලීටරයකටම | රු. 400/= | රු. 1,100/= |
| 5 මත්පැන් (මද්‍යසාර) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඊතයිල් මද්‍යසාර සඳහා වන බද්ද | සෑම ලීටරයකටම | රු. 10/= | රු. 10/= |

### *II වැනි උපලේඛනය*

#### ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීම සඳහා වූ අයදුම්පත්‍රය

අයදුම්පත්‍රයේ අංකය ඃ

1. අයදුම්කරුගේ නම ඃ ————————,
2. ජාතික හැඳුනුම්පත් අංකය ඃ ————————,
3. දුරකථන අංකය ඃ ————————,
4. විද්‍යුත් තැපැල ඃ ————————,
5. ලිපිනය ඃ ————————,

   පෞද්ගලික ලිපිනය ඃ ————————,

   ව්‍යාපාරික ලිපිනය ඃ ————————,
6. බලපත්‍රය ලබා දී ඇති ස්ථානයේ නම ඃ ————————,
7. බලපත්‍ර ලබා දී ඇති ස්ථානයේ ලිපිනය ඃ ————————,
8. ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීමට බලාපොරොත්තු වන රට ඃ ————————,
9. ඊතයිල් මද්‍යසාර නිෂ්පාදනය කළ රට ඃ ————————,

   (නාමමාත්‍රික ඉන්වොයිසිය මේ සමග ඇමිණිය යුතු ය.)
10. ආනයනය කිරීමට බලාපොරොත්තු වන ඊතයිල් මද්‍යසාර ලීටර් ප්‍රමාණය ඃ ————————,
11. ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීමට බලාපොරොත්තු වන දිනය ඃ ————————,

...................................

දිනය ඃ- ....................................... අයදුම්කරුගේ අත්සන.

---

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.*

යම් කොන්දේසියක් ඇත්නම් - ..........................................................................................................

ප්‍රතික්ෂේප කිරීමට හේතු ..........................................................................................................

ඊතයිල් මද්‍යසාර ආනයනය සඳහා අවසර දෙමි/අවසර නොදෙමි/ඉහත කොන්දේසිවලට යටත්ව අවසර දෙමි.

.........................................

අත්සන

දිනය ඃ .................................... සුරාබදු කොමසාරිස්

### *III වැනි උපලේඛනය*

අයදුම්පත්‍රයේ අංකය :-
ප්‍රධාන සුරාබදු කාර්යාලය :-

ආනයන හා අපනයන පාලක,
ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව,
කොළඹ.

**ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීම**

............................................................................ (ලිපිනය) පදිංචි ................................................................. ජාතික හැඳුනුම්පත් අංක දරන ........................................................................................................................................................................... (සම්පූර්ණ නම)

යන අයට මෙහි පහත සඳහන් ඊතයිල් මද්‍යසාර ප්‍රමාණය ආනයනය කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටින අතර එය ආනයනය කර ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් පසුව රේගු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කිරීමට ප්‍රථම ඊතයිල් මද්‍යසාර සඳහා වූ ආනයනය සුරාබද්ද අයකිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි.

නාමමාත්‍රික ඉන්වොයිස් අංකය :-
තොග ලීටර් ප්‍රමාණය :-
වලංගු කාලය :-

.........................................
සුරාබදු කොමසාරිස් ජනරාල්.

දිනය : ...........................

### *IV වැනි උපලේඛනය*

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ප්‍රධාන සුරාබදු කාර්යාලය,
කොළඹ.

**ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීම**

ආනයන අපනයන පාලකගේ අංක ....................... දරන බලපත්‍රය යටතේ ........................................................................................................ .....................................පදිංචි ................................ ජාතික හැඳුනුම්පත් අංක දරන ................................................................... (සම්පූර්ණ නම) විසින් මෙරටට ආනයනය කරන ලද ඊතයිල් මද්‍යසාර ප්‍රමාණය ...................................................... (ලීටර්) ක් නිකුත් කිරීමට සූදානම් බවත් ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත් ප්‍රකාශ කරමි.

බහාලුම් අංකය :-
ප්‍රමාණය තොග ලීටර් :-
වෙනත් කරුණු :-

..............................................
බලයලත් රේගු නිලධාරිගේ අත්සන.
බලපත්‍ර අංකය :-

දිනය : .............................

*V වැනි උපලේඛනය*

**ඊතයිල් මද්‍යසාර ආනයනය සඳහා වූ බලපත්‍රය**

අයදුම්පත්‍රයේ අංකය :

1. අයදුම්කරුගේ නම/ආයතනය : ————————,
2. ජාතික හැඳුනුම්පත් අංකය : ————————,
3. ලිපිනය : ————————,

    පෞද්ගලික ලිපිනය : ————————,

    ව්‍යාපාරික ලිපිනය : ————————,

4. දුරකථන අංකය : ————————,
5. විද්‍යුත් තැපැල : ————————,
6. බලපත්‍රය ලබා ගන්නා අරමුණ : ————————,
7. ආනයනය කරනු ලබන නිෂ්පාදනයේ සඳහන් විස්තරය :

| *බහාලුම් අංකය* | *ඊතයිල් මද්‍යසාර ලීටර් ප්‍රමාණය* | *සැර ප්‍රමාණය* | *සංශුද්ධ මද්‍යසාර ලීටර් ප්‍රමාණය* |
|---|---|---|---|
| | | | |
| | | | |

8. මාර්ගය : ————————,
9. ඊතයිල් මද්‍යසාර ගෙන යනු ලබන ස්ථානයේ නම හා ලිපිනය : ————————,
10. කාල පරාසය : ————————,
11. වෙනත් කරුණු : ————————,
12. දිනය : ————————,

.........................................

බලයලත් සුරාබදු නිලධාරී.

07 - 188

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.